විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2009 දිනය / திகதி / Date 2009- 11- 17

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/ 2009 (සංශෝධන - 01)

සියළුම දිස්ත්‍රික් ලේකම්වරු /ප්‍රාදේශීය ලේකම්වරු,
ත්‍රිවිධ හමුදාපතිවරු වෙත,

**සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම (2009)**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 3/ 2009 සංශෝධනය කරමින් මවිසින් පහත සඳහන් උපදෙස් නිකුත් කරමි.

01. **ප්‍රදාන පත්‍රය නිකුත් කිරීම**

ඉහත චක්‍රලේඛයේ 02 "අ" යටතේ දැනට සේවා විශ්‍රාම වැටුපක් ලබමින් සිටින අයගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කර අදාල ආකෘතිපත් මෙම දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන බව දන්වා ඇත.

එය පහත පරිදි සංශෝධනය කරමි .

සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදානයට අදාල විශ්‍රාම වැටුප් අංකය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන අතර ,ඉන් අනතුරුව සංශෝධිත ප්‍රදාන පත්‍රය ඒ ඒ හමුදා විශ්‍රාම වැටුප් අංශ විසින් නිකුත් කළ යුතු අතර ,එය පදනම් කොට ගෙන අදාල ගෙවීම් කටයුතු ප්‍රාදේශීය ලේකම් මඟින් සිදුකළ යුතුය.

02. **වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම**

1. වයස අවුරුදු 55 දක්වා වැටුප ගෙවන්නේ නම් එම වැටුපෙන් වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකළ යුතුය .
2. එම දායක මුදල් අයකිරීම වහාම ආරම්භ කළ යුතුය.
3. හිඟ දායක මුදල් ගණන් බලා එය දැනට අයකරන වාරිකය හා සමාන මුදලකින් අයකළ යුතුය.

4. වයස අවුරුදු 55 සම්පූර්ණ වන විට හිඟ මුදල් සම්පූර්ණයෙන්ම අයවී නොමැත්තේ නම් වයස අවුරුදු 55 දී සංශෝධිත විශ්‍රාම වැටුපෙන් ඉහත පරිදි හිඟ දායක මුදල් අයකළ යුතුය.

5. අවිවාහක පදනම මත දායක මුදල හා 2.5% පොළී මුදල් ආපසු ගෙවා ඇති විට එම මුදල්ද ඉහත සඳහන් පරිදි අයකළ යුතුය.

6. දායක මුදල් ගණන් බැලීම මාගේ චක්‍රලේඛ 3/ 2008 ප්‍රකාරව සිදුකළ යුතුය. දායක මුදල හා 2.5% පොළී මුදල් ආපසු ගෙවා ඇති විට එම මුළු එකතුවට (දායක මුදල + පොළිය) ඉහත 3/ 2008 අනුව පොළිය අයකළ යුතුය.

03. <u>වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම</u>

පහත සඳහන් අවස්ථාවන්හිදී වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු හිමිකම ප්‍රදානය කළ යුතුය.

i. වෛද්‍ය හේතූන් මත විශ්‍රාම යාමෙන් අනතුරුව විවාහ වී ඇත. වයස අවු. 55 දක්වා වැටුප ගෙවනු ලබන්නේ නම් හා ගෙවූ දායක මුදල් ආපසු ලබාගෙන ඇත්නම් අවු. 55 සම්පූර්ණවීමට පෙර විවාහ වන්නේ නම් දායක මුදල් අයකරගෙන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.

ii. විශ්‍රාම වැටුපක් නොගෙවන නමුත් දුබලතා විශ්‍රාම වැටුපක් ගෙවනු ලබන්නේ නම් හා වයස අවු. 55 දක්වා වැටුප් ගෙවනු ලැබේ නම් හා වයස අවු. 55 පෙර විවාහ වන්නේ නම් දායක මුදල් අයකරගෙන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.

iii. වසර 12 ක සේවා කාලයෙන් පසු හමුදා සේවයෙන් ඉවත් වූ විට දායක මුදල් ආපසු ලබා ගෙන ඇත්නම් හා යලිත් ස්වෙච්ඡා බලසේනාවට බැදී එහි වසර 22 ක් සම්පූර්ණවීමට පෙර ත්‍රස්තවාදී හේතූන් මත මිය යාම හා ස්වෙච්ඡා බලසේනා කාලය තුළ විවාහ වී ඇත්නම් දායක මුදල් අයකරගෙන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ජනාධිපති ලේකම් - ජනාධිපති කාර්යාලය
02. අග්‍රාමාත්‍ය ලේකම් - අග්‍රාමාත්‍ය කාර්යාලය
03. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
04. ලේකම් - මුදල් අමාත්‍යාංශය
05. විගණකාධිපති